# සාමාන්‍ය සමයේ පසළොස් වන සතිය - සඳුදා

## පළමුවන දේව ප්‍රකාශනය

නික්මයාම පොතෙන් ගත් පාඨයකි. නික්මයාම 1 : 8-14, 22

"ඉශ්රායෙල් ජනයා වැඩි වීම වළකන පිණිස ඔවුන්ට පීඩා කරමු."

එකල ජෝසෙප් ගැන කිසිවක් නොදත් අලුත් රජෙක් සිංහාසනාරූඪ විය. ඔහු තම සෙනඟට කතා කොට "බලන්න, ඉශ්රායෙල් ජනතාවගේ සෙනඟ අපට වඩා ගණනින් වැඩි වී බලවත්ව අපට තර්ජනයක් වී ඇත. දැන් ඉතින් කන් දෙන්න. ඔවුන්ගේ සංඛ්‍යාව වැඩි වීම වළකන පිණිස අපි ඔවුන් සම්බන්ධයෙන් සිහි නුවණින් ක්‍රියා කරමු. යම් හෙයකින් යුද්ධයක් ඇති වුවහොත්, ඔවුන් ද අපේ සතුරන් සමඟ පෙරමුණු බැඳගෙන, අපට විරුද්ධව සටන් කොට රට පාලනය කරන්නට පුළුවනැ"යි කීය. එබැවින් ඔවුන්ගෙන් බර වැඩ ගෙන, ඔවුන්ට පීඩා කරන පිණිස ඔව්හු ඔවුන් කෙරෙහි විධායකයන් පත් කළහ. මෙලෙස ඉශ්රායෙල් ජනයා පාරාවෝ සඳහා පීතොම් සහ රාමෙසෙස් යන ගබඩා නගර ගොඩ නැගූහ. එහෙත් පීඩා විඳින්න විඳින්න ඔව්හු වඩ වඩා වැඩි වී, වර්ධනය වූහ. මිසර දේශවාසීහු ද ඉශ්රායෙල් සෙනඟට බිය වී, ඔවුන්ගෙන් බලාත්කාරයෙන් වැඩ ගත්හ. මෙලෙස කුඹල් කර්මාන්තය, ගඩොල් කර්මාන්තය හා කෙත්වල විවිධ කෘෂි කර්මාන්ත වැනි දරුණු වහල් මෙහෙවරින් ඔව්හු ඔවුන්ගේ ජීවිත දැරිය නොහැකි තත්ත්වයකට පත් කළහ. තවද, ඔව්හු ඔවුන්ගෙන් බලාත්කාරයෙන් සියලු ආකාර බර වැඩ ගත්හ.

එවිට පාරාවෝ මුළු සෙනඟ අමතා, හේබ්‍රෙව්වරුන්ට උපදින හැම පිරිමි ළමයෙකුම නයිල් ගඟට විසි කළ යුතුය. සෑම දූවකට ජීවත් වන්නට ඉඩ දිය යුතුය" යි අණ කළේය.

දේව වචනය මෙසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 124 : 1-8

පිළිතුර: අපගේ පිහිට සමිඳාණන්ගේ නාමයෙහි ය.

ගීය:

ඉශ්රායෙල් මෙසේ කියත්වා! අපේ පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්, අපට විරුද්ධව සතුරන් නැඟිට ආ කල, අපේ පැත්තට සමිඳාණෝ නොසිටි සේක් නම්, ඔවුන්ගේ උදහස අපට විරුද්ධව ඇවිළුණු කල, අප පණ පිටින් ගිල ගන්නට ඔවුන්ට ඉඩ තිබිණි.

එවිට ජලයෙන් අප වැසී යන්නට ඉඩ තිබිණි. දිය දහරින් අප යට කොට ගසා ගෙන යන්නට ඉඩ තිබිණි. සැඩ ජල කඳ අප යට කොට ගසාගෙන යන්නට ඉඩ තිබිණි. අපේ සතුරන්ට අප ගොදුරු වීමට ඉඩ නුදුන් සමිඳාණන්ට ප්‍රශංසා වේවා!

පක්ෂි වැද්දාගේ උගුලෙන් ගැලවී යන පක්ෂියෙකු මෙන් අපි මිදුණෙමු.
උගුල බිඳී ගියේය. අපි ගැලවුණෙමු.
අපේ පිහිටට ඇත්තේ අහසත් පොළොවත් මැවූ සමිඳුන්ගේ නාමය ය.”

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, ඔබ පුතණුවන්ගේ වචන පිළිගැනීමට අප සිත් පැහැදුව මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!

“ඔබ පිළිගන්නා මා පිළිගන්නේ ය. මා පිළිගන්නා මා එවූ තැනැන් වහන්සේ පිළිගන්නේ ය”යි ස්වාමින් වහන්සේ වදාළ සේක.

ආලේලූයා!

## සුවිශේෂය

මතෙව්තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

මතෙව් 10 : 34-11 : 1

“මම මිහිපිට සාමය දෙන පිණිස ආවෙමි යි නොසිතන්න. සාමය නොව කඩුවක් දෙන පිණිස ආවෙමි.”

“මම මිහිපිට සාමය දෙන පිණිස ආවෙමි යි නොසිතන්න. සාමය නොව කඩුවක් දෙන පිණිස ආවෙමි. මන්ද, තම පුතා පියා සමඟ ද, දුව සිය මවු සමඟ ද ලේලි සිය නැන්දම්මා සමඟ ද භේද කරවන පිණිස ආවෙමි. මිනිසෙකුගේ සතුරෝ නම් ඔහුගේ ම ගෙදර වැසියෝ ය. මට වඩා පියාටවත් මවුටවත් ප්‍රේම කරන්නා මට සුදුසු නොවේ. මට වඩා පුතාටවත්, දුවටවත් ප්‍රේම කරන්නා මට සුදුසු නොවේ. සිය කුරුසිය දරාගෙන මා අනුගමනය නොකරන තැනැත්තා මට සුදුසු නොවේ. සිය දිවි රැක ගන්නා එය නැති කර ගනී. මා නිසා සිය දිවි නැති කර ගන්නා එය රැක ගනී.”

"ඔබ පිළිගන්නා මා පිළිගන්නේය. මා පිළිගන්නා මා එවූ තැනැන් වහන්සේ පිළිගන්නේය. දිවැසිවරයෙකු වන නිසා දිවැසිවරයෙකු පිළිගන්නා දිවැසිවරයෙකුගේ විපාකය ලබයි. සත් පුරුෂයෙකු වන නිසා සත් පුරුෂයෙකු පිළිගන්නා සත් පුරුෂයෙකුගේ විපාකය ලබයි. මේ මාගේ ගෝලයන්ගෙන් ඉතා සුළු කෙනෙකුට වුව ද ඔහු ගෝලයෙකු වන නිසා බොන්න ඇල් වතුර කෝප්පයක්වත් යමෙක් දෙන්නේ ද, සැබැවින්ම මම ඔබට කියමි. ඔහුගේ විපාකය කිසිසේත් නැති නොවන්නේ ය."

ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් දොළොස් දෙනාට උවදෙස් දී නිම කළ පසු එතැනින් පිටත්ව, ඔවුන්ගේ නුවරවල අනුශාසනා කරන පිණිසත්, දහම් දෙසන පිණිසත් ගිය සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.